# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1869/45 – 2014 ජූලි 04 වැනි සිකුරාදා – 2014.07.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟවට කෝරළේ සුළු කොට්ඨාසයේ (මහනුවර මහනගර සභා ප්‍රදේශයේ අස්ගිරිය කලාප 06) අස්ගිරිය ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මූ.පි. මහ 5504 හා 2003.10.12 දිනැති මුලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කොටස් තුන (03) ට මායිම්:

**01. කැබලි අංක 3 – වැලිකන්දහේන – ප්‍රමාණය: හෙක්. 0.0022 ක් පමණ**

උතුරට: පීපී මහ 5292 හි කැබලි අංක 01 සහ 02; නැගෙනහිරට: කැබලි අංක 02; දකුණට: කැබලි අංක 02, 04, 05 සහ නිමාලි පෙරේරා හිමිකම් කියන වැලිකන්දහේන; බටහිරට: පීපී මහ 5292 හි කැබලි අංක 01.

**02. කැබලි අංක 6 – වැලිකන්දහේන – ප්‍රමාණය: හෙක්. 0.0015 ක් පමණ**

උතුරට: කැබලි අංක 05; නැගෙනහිරට: කැබලි අංක 05 සහ නිමාලි පෙරේරා හිමිකම් කියන වැලිකන්දහේන; දකුණට: නිමාලි පෙරේරා හිමිකම් කියන වැලිකන්දහේන; බටහිරට: නිමාලි පෙරේරා හිමිකම් කියන වැලිකන්දහේන සහ කැබලි අංක 05.

**03. කැබලි අංක 7 – වැලිකන්දහේන – ප්‍රමාණය: හෙක්. 0.0004 ක් පමණ**

උතුරට සහ නැගෙනහිරට: කැබලි අංක 05; දකුණට: දුමින්ද පෙරේරා හිමිකම් කියන වැලිකන්දහේන; බටහිරට: දුමින්ද පෙරේරා හිමිකම් කියන වැලිකන්දහේන සහ කැබලි අංක 05.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/9/2012/ඩබ්එස්/85.
2014 පෙබරවාරි මස 06 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 – 613

1A – G19835 – 20 (2014/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*